# වාර්ෂික වාර්තාව - 2013

## සී/ස සීනෝර් පදනම

335, ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10, ශ්‍රී ලංකාව

ISO 9001-2008 CERTIFIED

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 02 |
| සමාගමේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ | 03 |
| සමාගමේ ඉතිහාසය | 04 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 05 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 07 |
| මූල්‍ය ප්‍රගතිය,වත්මන් ක්‍රියාකාරකම් සහ අනාගත සැලැස්ම | 09 |
| විගණන වාර්තාව | 15 |
| ආදායම් ප්‍රකාශය | 17 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 18 |
| ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 19 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 20 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් | 21 |
| විස්තරාත්මක නිෂ්පාදන, වෙළඳ ලාභ/අලාභ ගිණුම | 27 |
| විගණන වාර්තාව පිළිබඳ පැහැදිලි කිරීම් | 35 |

# ආයතනික තොරතුරු

| | |
|---|---|
| සමාගමේ නම | : සීමාසහිත සීනෝර් පදනම |
| නෛතික පදනම | : 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සහ අනතුරුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමිත සමාගමකි. |
| ලියාපදිංචි කාර්යාලය | : 90,(335) ඩී. ආර් විජේවර්ධන මාවත, කොළඹ 10 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | : ඉංජිනේරු බී.වී.සරත් කුමාර ද සිල්වා මහතා<br>(2010.05.20 දින සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හා සභාපති ලෙස පත්විය)<br>කේ. උපිත් අනුරාධ මහතා<br>(2010.05.20 දින සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හා කළමණාකාර අධ්‍යක්ෂකවරයා ලෙස පත් විය)<br>පී.ඒ.එස්. අතුල කුමාර මහතා<br>(2010.06.23 දින අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වු අතර මහා භාණ්ඩාගාර නියෝජිතයාද වේ. )<br>පී.ඩී.ගුනදාස මහතා<br>(2010.08.25 දින අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් විය)<br>එම්.එෆ්.කේ.ෂයිරාස් මහතා<br>(2010.08.25 දින අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්විය) |
| ලේකම් | : ඒ.ඇන්ඩ් ඒ. ඇසෝසියේට්ස් (පුද්) සමාගම |
| විගණකවරු | : ගුණසේකර රත්නායක සහ සමාගම<br>වරලත් ගණකාධිකාරීවරු<br>නො.65/3,චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 |
| බැංකුකරුවන් | : ලංකා බැංකුව<br>හැටන් නැෂනල් බැංකුව<br>මහජන බැංකුව<br>පෑන් ඒෂියා බැංකුව |
| කම්හල්/වැඩහල් | : මට්ටක්කුලිය යාත්‍රාංගනය<br>බේරුවල යාත්‍රාංගනය ( යෝජිත)<br>කරෙයිනගර් යාත්‍රාංගනය( යෝජිත) |
| වෙනත් ව්‍යාපෘති | : සීනෝර් ඔරියන්ට් සී ෆුඩ් රෙස්ටුරන්ට්<br>(කළමණාකරන ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ) |
| | : මෝටර් රථ වැඩහල මත්තුමගල<br>(කළමණාකරන ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ) |

## අපගේ දැක්ම

ශ්‍රී ලංකාව තුල ධීවර යාත්‍රා නිෂ්පාදනයේ,සංචාරක කර්මාන්තයට අදාල යාත්‍රා නිෂ්පාදනයේ හා  මාළු දැල් හා ඒ ආශ්‍රිත උපාංග සැපයීමේ ප්‍රමුඛයා බවට පත්වීමත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා නිෂ්පාදකයෙකු බවට පත්වීම

## අපගේ මෙහෙවර

කාර්යක්‍ෂම හා ක්‍රියාකාරී රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වීම හා උසස් ප්‍රමිතියෙන් යුක්ත වු ධීවර යාත්‍රා , සංචාරක කර්මාන්තයට අදාල යාත්‍රා හා ධීවර කර්මාන්තයට ආශ්‍රිත උපාංග තරඟකාරී මිලකට පාරිභෝගික ජනතාව වෙත ලබා දීම

## අපගේ පරමාර්ථ

- ෆයිබර් ග්ලාස් යාත්‍රා අපනයනකරුවන් අතර සැලකිය යුතු වැදගත් අපනයනකරුවකු බවට පත් වීම
- ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් සහිත ෆයිබර් ග්ලාස් නිෂ්පාදකයකු බවට පත්වීම
- විදේශයන්හි ෆයිබර් ග්ලාස් යාත්‍රා නිෂ්පාදන ක්‍ෂෙත්‍රය තුල ආයෝජනය කරන්නෙකු බවට පත්වීම
- ප්‍රමිතියෙන් යුත් ධීවර යාත්‍රා හා මාළු දැල් සැපයීම තුලින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ සුවිශේෂ අංශයකට දායක වීම
- ඉහලම පාරිභෝගික සේවාවක් සපයන්නකු බවට පත්වීම

# සමාගමේ ඉතිහාසය

රජයට පවරාගත් සීමාසහිත සී නෝර් සංවර්ධන පදනමේ ව්‍යාපාර කටයුතු භාරගෙන පවත්වාගෙන යාම සඳහා 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීමා සහිත සීනෝර් පදනම 1990.01.17 දින සංස්ථාගත කරනු ලැබීය.

ගෘහස්ථ ධීවර ජනතාවගේ අධ්‍යාපනය හා සුබසාධන නැංවීමට කැප වූ ලාභ නොලබන සංවිධානයක් ලෙස 1967 දී සීනෝර් සංවර්ධන පදනම සිය කටයුතු ආරම්භ කරනු ලැබිය.කාලයාගේ ඇවෑමෙන් මෙම සංවිධානය පහත දක්වා ඇති පරිදි විවිධ වෙනස්කම්වලට භාජනය විය.

1967 නෝර්විපියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන නෝර්වේ ගොඩ්ටෙම්ප්ලර් උන්ග්ඩෝම්ස් පෝර්බන්ඩ් (එන්.පී. යු) වෙතින් ලත් ආධාර ප්‍රයෝජනයට ගනිමින් සීනෝර් සංවර්ධන පදනම පිහිටුවා එහි කටයුතු ඇරඹිය.

1971 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ඇපයෙන් සීමිත පොදු සමාගම සංස්ථාගත කොට සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම යන නමින් හැදින්විය.

1985 ශ්‍රී ලංකා රජය විසින් 1971 අංක 35 දරණ වෙළඳ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරාගත් අතර රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම නමින් හැදින්විය

1990 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ක්‍රියාත්මක වීමෙන් රජයට පවරාගත් සිමාසහිත සීනෝර් සංවර්ධන පදනම අහෝසි වී එහි අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1990.01.17 දින සීමාසහිත සීනෝර් පදනම සංස්ථාගත කරනු ලැබ ඇත.

මෙම නව සමාගමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය ( රු. 40,000,000/-) භාන්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර ඇත.

# සීමාසහිත සීනෝර් පදනම

## සභාපතිතුමාගේ සමාලෝචනය

2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ මූල්‍යමය වර්ෂය වෙනුවෙන් සැකසුනු, වාර්ථාව කැබිනට් අමාත්‍යතුමන් වෙත සතුටින් පිළිගන්වනු කැමැත්තමි.

වාර්ෂිකව රු. මිලියන 35 ක පමණ පාඩුවක් ලද සීනෝර් පදනම, නව අධ්‍යක්ෂක මණ්ඩලයේ කළමණාකාරිත්වය මත 2013 වසරේදී ලාභ ලබන ආයතනයක් බවට පත්ව ඇති බව සතුටින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ මඟ පෙන්වීමක් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කාර්යක්ෂම කාර්යය මණ්ඩලයේ කළමණාකාරීත්වයන් නිසා ඉතා විශාල දියුණුවක් ලගාකර ගැනීමට 2013 වසරේදී හැකිවිය.

2013 වසරේදී අත්කර ගත් ලාභ ලැබීම ප්‍රධාන ලෙස පහත සඳහන් කාරණා නිසා සිදුවිය.

(a) සාගරික ඉදිකිරීම් සඳහා යොමු වීම.

(b) 2011 වසරේදී රු.මිලියන 325 ඉපයීම සඳහා අවශ්‍ය සේවකයින් 354 ක් යොදාගත් අතර 2013 වසරේදී රු. මිලියන 267 ඉපයීම සඳහා සේවකයන් 100 පමණක් යොදා ගැනීම කාර්යක්ෂම සේවක කළමණාකරණ ක්‍රියාවලියක් තුලින් සිදුවිය.
එසේම වියදම් පාලනය තුලින් 2013 වසරේ ශුද්ධ ලාභයක් ලබාගැනීමට හැකිවිය.

(c) ආයතනයේ සේවක පිරිස 354 සිට 100 දක්වා 70% ප්‍රතිශතයකින් අඩුකර ගැනීම.

බෝට්ටු නිෂ්පාදනය තුලින් ද සීනෝර් ආයතනයේ ලාභ ලැබීමේ ප්‍රතිශතයක් අත්කර ගෙන ඇත. අඩි 45 දිගැති ඉන්ධන සහ සුළං ආධාරයෙන් ක්‍රියාත්මක වන ත්‍රිත්ව බඳ සහිත බෝට්ටුවක් නිෂ්පාදනය කර සෝමාලියාවට අපනයනය කර ඇත. එසේම එහි පවතින ආර්ථික වාසිය හා පරිසර හිතකාමී වන බව නිසා එවැනි තවත් බෝට්ටු 3 ක් සඳහා ඇනවුම් ලැබී ඇත.

මිරිදිය ධීවර කටයුතු දිරිගැන්වීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඇනවුම් කරන ලද බෝට්ටු ප්‍රමාණය නිෂ්පාදනය කිරීම වෙනුවෙන් සීනෝර් පදනම පසුගිය වසර තුල මහත් පරිශ්‍රමයකින් කටයුතු කළේය. අදාල ඇනවුමෙන් 90% ක ප්‍රමාණයක් නිමකිරීමට හැකි වූ අතර සීනෝර් පදනමේ යාත්‍රා අංගනය වැඩිදියුණු කිරීමේ කටයුතු සහ අක්වෙරළ ඉදිකිරීම් කටයුතු සඳහා ද දායක විය.

දික්ඕවිට ධීවර වරය භාවිතා කරන ධීවරයින්ට සේවයක් ලෙස අන්තර්ජාතික තත්වයන්ට අනුකූලව නව තාක්ෂණය සහ උපකරණ භාවිතාකරමින් ඉහල ප්‍රමිතියකින් යුත් බෝට්ටු නිර්මාණය, සැලැස්ම සහ නිෂ්පාදනය කිරීම සඳහා රු මිලියන 250 ලබාදීමට කැබිනට් අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති අතර. එහි ප්‍රථම අදියර ලෙස කැළණි ගඟ අසබඩ යාත්‍රා අංගනයේ කටයුතු නිමකර ඇත. මෙම යාත්‍රාංගනයේ දී සිදුවන බෝට්ටු නිෂ්පාදනය බාහිර පාරිසරික තත්වයන් පාලනය කල විශේෂයෙන් ජලවාෂ්ප පාලනය සහිත පරිසරයක් තුල ආදාල නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරයි.

සීනෝර් පදනමේ බෝට්ටු නිෂ්පාදනය ඉතා උසස් මට්ටමක පවත්වාගෙන යාම සඳහා ප්‍රීමාමැරයින් අධිතාක්ෂණික මෘදුකාංග යොදාගෙන ඇති අතර එමගින් බෝට්ටු වල සමබරතාවය, ආකෘතික, ශක්තිය හා ජල තරණය නිවැරදි මට්ටමක පවත්වා ගත හැක.

මෙමගින් යාත්‍රා නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික අවස්ථාවන්හිදී දෝෂ හඳුනා ගැනීමටත් අවශ්‍ය වැඩිදියුණු කිරීම් හා ප්‍රතිකර්ම එම අවස්ථාවේදීම සිදුකිරීමටත් හැකියාව ඇති අතර එමගින් කාලය සහ මුදල් ඉතා විශාල ලෙස ඉතිරිකර ගැනීමට හැකියාව ඇත. මෙම වැඩිදියුණු කල තාක්ෂණය නිසා බෝට්ටු නිෂ්පාදනය ඉතා නිවැරදි ලෙසත් වියදම් අවම වන ලෙසත් සිදුකිරීමට ඇති හැකියාව නිසා අන්තර් ජාතික වෙළඳපොල සඳහා සීනෝර් පදනමේ නිෂ්පාදන සහ සේවය ව්‍යාප්ත කිරීමට කටයුතු සිදුකරමින් පවතී.

මාගේ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ දැනුම සහ පලපුරුද්ද සමග සීනෝර් සතු පහසුකම් යොදාගනිමින් සීනෝර් හි සේවය සාගරික ඉදිකිරීම් ක්ෂේත්‍රය වෙත ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ. එහි ප්‍රථිපලයක් ලෙස නවීකරණය කරන ලද දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය නිමකරීමට හැකිවීම මම ආඩම්බරයක් ලෙස සලකමි. මෙම දික්ඕවිට වරාය නිරිත දිග ආසියාවේ හොදම වරාය බවට පත්ව ඇත. සීනෝර් පදනම අනාගතයේදී සාගරික ඉදිකිරීම් කටයුතු වල නියැලීමට හැකි වේ. තවද මරදාන (බේරුවල) නැංගුරම්පල හා දික්ඕවිට Landing Site රු මිලියන 200 සහ රු. මිලියන 73 ලෙස පිළිවෙලින් ඉදිකිරීම් කටයුතු අප වෙත පැවරීම තුලින් 2014 වසරේ අදායම වැඩි කර ගැනීමට හැකියාවක් ඇත.
මෙම ඉදිකිරීම් සමගම සීනොර් පදනමේ කිර්ති නාමය උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවේ.

බහුදින මව් යාත්‍රාවන් මිලදී ගැනීමේ ක්‍රියාවලියේ උපදේශනය සහ .. නිර්ණය කිරීම සඳහා අප රේඛීය අමාත්‍යාංශය අප ආයතනය වෙත විශ්වාසය තබා ඇති අතර “මහින්ද චින්තන” ප්‍රතිපත්ති ප්‍රකාශන අනුව ධීවර ක්ෂෙත්‍රයේ දියුණුව වෙනුවෙන් බහුදින යාත්‍රා නිෂ්පාදනය සීනෝර් පදනම වෙත පැවරීම තුලින් අප අමාත්‍යාංශය සිනෝර් පදනම මත විශ්වාසය තබා ඇත.

බෝට්ටු නිෂ්පාදනයේ සහ සාගරික ඉදිකිරීම් වල දී සීනෝර් කීර්ති නාමය ලෝකය වෙත ගෙන යාම අපගේ බලාපොරොත්තුව වී ඇත. මෙම ක්‍රියාදාමය නිසා සැලකිය යුතු විදේශ මුදල් ප්‍රමාණයක ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමට හැකිවනු ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වෙළඳ) තනතුර සහ නව වෙළඳ ප්‍රචාරණයක් අනුමත කිරීම තුලින් සීනෝර් සමාගම තම ඉලක්ක සපුරා ගැනීමට බලාපොරොත්තු වේ. බෝට්ටු නිෂ්පාදන අංගනය නවීකරණය සහ නවීන මෘදුකාංගයක් මිලදී ගැනීම තුලින් මෙම ඉලක්ක වෙත ගමන් කිරීමට සීනෝර් පදනමට හැකියාව ඇත.

2013 වසර සීනෝර් පදනමට සාර්ථක වසරක් බව මම ආඩම්බරයෙන් සඳහන් කරමි. ගරු අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ අධීක්ෂණයත්, මිලකල නොහැකි සහයෝගයත් වෙනුවෙන් මම ස්තුති වන්ත වෙමි. එසේම රේඛීය අමාත්‍යාංශයේ සියළුම උසස් නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය හා සහභාගීත්වය වෙනුවෙන් මම ඉතාමත් ස්තුතිවන්ත වන අතර ඉතා අමාරු අවස්ථාවන් වලදී ලබාදුන් සහයෝගය අගය කොට සලකමි. අවසාන කොට ආයතනයේ සාමාන්‍යාධිකාරී ඇතුළු කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම සහ රාජකාරීය සඳහා ස්තුතිවන්ත වන අතර ඔවුන් සියළු දෙනා මනා නායකත්වයක් සහිත කණ්ඩායමකට අයත්ව ඇති බව විශ්වාස කරමි.

ස්තුතියි.
අත්සන් කලේ
ඉංජිනේරු බි.වී. සරත් කුමාර ද සිල්වා
සභාපති සී/ස සීනෝර් පදනම

## 2013.12.31 දිනෙන් අවසන් වු වර්ෂය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

01 විගණන ගිණුම

2013.12.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා වන විගණනය කල ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරමු

02 **මූල්‍ය ප්‍රතිඵල**

වර්ෂය සඳහා වු ශුද්ධ ලාභය/(පාඩුව) 19 වැනි පිටුවේ ආදායම් ප්‍රකාශයේ හෙළිදරව් කර ඇත.

03 **තත්ත්ව ප්‍රකාශය**

සමාගමේ තත්ත්ව ප්‍රකාශය 20 වැනි පිටුවේ දක්වා ඇත.

04 **මූලික ක්‍රියාකාරකම්**

සමාගමේ ව්‍යාපාරික කටයුතු පසුගිය වසර හා සාපේක්ෂව නොවෙනස්ව පැවතිය අතර එම ව්‍යාපාරික ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ෆයිබර් ග්ලාස් ධීවර යාත්‍රා, විනෝද යාත්‍රා හා අනිකුත් ෆයිබර් ග්ලාස් නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම
- නයිලෝන් මාළු දැල් හා ඒ හා බැදුනු අනෙකුත් භාණ්ඩ අලෙවිය කිරීම
- ධීවර යාත්‍රා හා යාත්‍රා එංජින් අළුත්වැඩියා කිරීම සඳහා වැඩහල් ක්‍රියාත්මක කිරීම හා විවිධ යාත්‍රා උපකරන අලෙවි කිරීම.

ඉහත කී ක්‍රියාකාරම් වලට අමතරව 2012 වසරේ සිට පහත සඳහන් ව්‍යාපාරික කටයුතු කෙරෙහිද අවධානය යොමු කර ක්‍රියාත්මක කර ඇත.

- සියළුම වර්ගයේ යාත්‍රාවන් සඳහා සැලසුම් සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම
- යාත්‍රාංගන හා අක්වෙරළ සංවර්ධන කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉටු කිරීම
- පවතින යත්‍රාංගන පහසුකම් වැඩිදියුණු කිරීම හා අන්තර්ජාතික ප්‍රමිතියට ගෙන ඒම.

05 **ලාභාංශ**

2013.12.31 දිනෙන් අවසන් වු වර්ෂය වෙනුවෙන් ලාභාංශ ගෙවීමක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

06 **සමාගම හා අධක්‍ෂ්‍යවරු අතර ගිවිසුම ගත බැදිම**

වර්ෂය තුල කිසිදු අධක්ෂවරයෙකු සමාගම සමඟ ගිවිසුම්ගත බැදිමකට ලක් වී නොතිබුනි.

07 **සමාගමේ කොටස් හා අධක්ෂවරු අතර පැවති ගිවිසුම් ගත බැදිම්**

201312.31 දිනෙන් අවසන් වු වර්ෂය තුලදි කිසිදු අධක්ෂවරයෙකු සමාගමේ කොටස් කිසිවක් දරා නොතිබුනි.

08 **ප්‍රමාණාත්මක කොටස් දැරීම**

ශේෂ පත්‍රයේ සඳහන් දිනට සමාගමේ නිකුත් කරනු ලැබූ කොටස් සියල්ල භාණ්ඩාගාරයේ ලේකම් විසින් දරනු ලැබ ඇත.

09 **පුණ්‍යාධාර ගෙවීම්**

දේශපාලන හේතූන් සඳහා හෝ පුණ්‍යාධාර වශයෙන් හෝ වන කිසිදු ගෙවීමක් සමාගම විසින් වර්ෂය තුළදී සිදු කර නැත.

10 **ස්ථාවර වත්කම් වල වෙනස්වීම්**

වර්ෂය තුල සමාගමේ ස්ථාවර වත්කම්වල වෙනස්වීම් **33** වැනි පිටුවේ උපලේඛන යෙහි දක්වා ඇත.

11 **බැංකු පහසුකම්**

වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා සමාගමේ බැංකු පහසුකම් අවශ්‍යතා අඛණ්ඩව සපයන සමාගමේ බැංකු කරුවන් ආරක්ෂිත ඇපකර මත ඉදිරියටත් මෙම පහසුකම් සපයනු ලබන බව විශ්වාස කරමු.

12 **විගණකවරු පත් කිරීම**

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත විගනකාධිපතිවරයා විසින් නම් කරන ලද වරලත් ගණකාධිකාරී සමාගමක් වන ගුනසේකර රත්නායක සහ සමාගම 23 වැනි වාර්ෂික මහා සමුළුවේදි සමාගමේ විගනකවරුන් වශයෙන් පත් කර ගෙන ඇත.

13 2013.12.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

ඉංජිනේරු බී.වී.එස්.කේ ද සිල්වා මහතා – (සභාපතී)
කේ. උපිත් අනුරාධ මහතා
ජී.ජී.එස්.අතුල කුමාර මහතා – (භාණ්ඩාගාර නියෝජිත)
ජී.ඩී.ගුණදාස මහතා
එම්.එෆ්. කේ. ෂයිරාස් මහතා

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ඇ/කලේ
ඉංජිනේරු බී.වී.එස්.කේ ද සිල්වා මහතා
සභාපති

ඇ/කලේ
ඒ.ඒ. ඇන්ඩ් ඇසෝසියෙස් සමාගම
සමාගමේ ලේකම්

## 2013 වර්ෂය තුල ප්‍රගතිය

- **ෆයිබර්ග්ලාස් යාත්‍රා හා ඒ ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීම**

සාමාලෝචනය කරනු ලබන 2013 වර්ෂය තුලදි පෞද්ගලික ගැනුම්කරුවන්ගෙන් විශාල යාත්‍රා සඳහා ලැබු ඉල්ලුම/ඇණවුම් ලැබීම ඉතාමත් අඩුමට්ටමක පවතුනි. ගැඹුරු දියේ මසුන් නෙලිය හැකි යාත්‍රා වු අඩි 49 1/2 ,අඩි 45 හා අඩි 42 යාත්‍රා නිෂ්පාදනය කරන ලද්දේ නිශ්චිත ඇණවුම්වලට පමනි. මෙම වර්ෂය තුලදි සමාගම විසින් දකුනු පළාතේ පෞද්ගලික ගැනුම්කරුවකුට අඩි 49 මගින් ප්‍රවාහනය කල හැකි යාත්‍රාවක් නිෂ්පාදනය කර සපයන ලද අතර එය ඔහු විසින් දකුනු පලාතේ සංචාරක කර්මාන්තයට හා අනිකුත් විනෝද කටයුතු සඳහා යොදවා ඇත. මෙවැනි සංචාරක යාත්‍රා සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර එවැනි යාත්‍රා 3 ක් සඳහා මේ වන විට පෞද්ගලික ගැනුම්කරුවන්ගෙන් ඇනවුම් ලැබි ඇත.

මේ වන විට අඩි 45 ට්‍රයිමරන් ( Trimaran) අච්චුවේ නිෂ්පාදිත යාත්‍රාවේ වැඩ කටයුතු සම්පුර්ණයෙන්ම නිම කර ඇති අතර, එය මේ වන විටි සෝමාලියා දේශයට අපනයනය කර ඇත . මෙම යාත්‍රාව සුලං බලයෙන් හා ඉන්ධන මගින් ක්‍රියාත්මක කල හැකි යාත්‍රාවක් වන බැවින් ආර්ථිකමය වශයෙන් හා පාරිසරික වශයෙන් ඉතාමත් වාසි සහගත වනු ඇත. මෙම යාත්‍රාවේ ගැනුම්කරු වුයේ නෙඩිසම් ෆවුන්ඩේෂන් නැමැති විදේශිය ආයතනයයි. අඩි 45 දිගැති ට්‍රයිමනරන් බඳ සහිත යාත්‍රා නිෂ්පාදනය ඉතා සාර්ථකව සිදුකල අතර සෝමාලියාව වෙත අපනයනය කිරීම 2013 මාර්තු මස තුලදී සුදුවිය. ඉන්ධන මෙන්ම සුළඟ භාවිතයෙන් යාත්‍රා කිරීමට මෙම යාත්‍රා වලට හැකියාව ඇත. මෙය පාරිසරිකව හිතකර මෙන්ම ආර්ථිකවද වාසිදායකය. එසේම මෙම ඇණවුම් කරු විසින් යාත්‍රා 3ක් මිලදී ගැනීමට ඇණවුම්කරුවෙකු සෝමාලිහාවෙන් හඳුන්වා දුන් අතර එම යාත්‍රා 2014 ජුනි මස දී අපනයනය කිරීමට බලාපොරොත්තු වෙමි.

වර්ෂය තුලදි අප විසින් මිරිදිය කර්මාන්තයට අදල වන්නාවු මිරිදිය ඔරු විශාල ප්‍රමානයක් නිශ්පාදනය කර ඇති අතර මෙම ඇනවුම් ප්‍රධාන වශයෙන්ම සිනෝර් පදනමට ලැබි ඇත්තේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් හා විවිධ පළාත් සභා මගිනි. මීට අමතරව අප විසින් විශාල සංඛ්‍යාවක් වන විවිධ නිෂ්පාදන එනම්, මාළු පෙට්ටි,අයිස් පෙට්ටි,පැඩල් යාත්‍රා අචි ගබඩා කරනු ලබන ඇසුරුම්, ආරක්‍ෂක නියාමක කුටි, නිෂ්පාදනය කර ඇති අතර අපගේ යාත්‍රා නිශ්පාදන අංශයේ වාර්ෂික සමස්ත ප්‍රගතිය 91% ක මට්ටමක පවති. කෙසේ වුවද භාවිතාකරනිනන්ගේ ගෘහ ආර්ථිකය, ඉන්ධන මිල සහ නිෂ්පාදන වියදම් වැඩිවීම මෙම යාත්‍රා විකිණීමේදී සැලකිය යුතු සාධකයක් බවට පත්වේ.

***මට්ටක්කුලිය යාත්‍රාංගනය නවීකරනය කිරීම***

මේ වන විට සීමාසහිත සිනෝර් පදනමට මට්ටක්කුලිය යාත්‍රාංගනය ජාත්‍යාන්තරව පිලිගත් ප්‍රමිතියට අනුකූලව සංවර්ධන කර ගැනීමට හැකි වැදගත් අවස්ථාවක් උදා වී ඇති අතර එතුලින් සමාගමට අමතරව ආදායමක් යාත්‍රා අළුත්වැඩියාව හා නඩත්තුව තුලින් ලබා ගත හැකි වී ඇත.තවද දික්ඕවිට වරාය ව්‍යාපෘතිය යටතේ කටයුතු කිරීමට හැකිවීමද වාසිදායක තත්ත්වයකි. මෙහිදි ධීවර ජනතාවටද තමාන්ගේ යාත්‍රා ඉතාමත් සාධාරන මිලකට සහ ප්‍රමිතියකින් යුක්තව නවීකරනය කර දීමද සමාගමේ වගකිමක් ලෙස සලකයි. තවද මෙම ලැබෙන පහසුකම නවීනතම යන්ත්‍රෝපකරන හා තාක්‍ෂණික දැනුම සමඟ වන බැවින් සීනෝර් පදනමට තමන්ගේ කටයුතු සම්බන්ධයෙන් විශ්වාසවන්තව හා පිළිගත් සම්මතයන්ට අනුකූලව කටයුතු කල හැකිය. මෙම නවීකරනය කිරීම් සඳහා වැය කරන ලද ආයෝජනය රු.මිලියන 250කි.

*අක්වෙරළ ඉදිකිරීම් කටයුතු*

2013 වසර තුලදී සීනෝර් පදනම අක්වෙරළ ඉදිකිරීම් කටයුතු සඳහා යොමු වූ අතර රු. මිලියන 86 ක ලාභයක් ඉපයීමට හැකිවිය. වරාය සංවර්ධනය, නැංගුරම්පල ඉදිකිරීම් සහ Landing Site ඉදිකිරීම් සිදු කිරීම වැනි මහා පරිමාණ ඉදිකිරීම් මත යොමුවීම මගින් ආයතනයට නව අත්දැකීමක් ලබාගැනීමට හැකිවන අතර අනාගත සුභසිද්ධියට ඉවහල් වේ.

මරදාන, බේරුවල නැංගුරම්පල ව්‍යාපෘතිය (රු. මිලියන 200) හා දික්ඕවිට ධීවර වරාය තොටුපල ව්‍යාපෘතිය (රු. මිලියන 73) 2014 වසරේදී නිමකිරීමට සැලසුම් කර ඇත.

*කරෙයිනගර් යාත්‍රාංගනය*

2010.10.13 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සම්ප්‍රදායික හා කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පාලනය වන නෝත්සී සමාගම විසින් මෙහෙය වූ යාපනය අර්ධද්වීපයේ කරෙයිනගර් ප්‍රදේශයේ පිහිටි යාත්‍රාංගනය සී/ස සිනෝර් පදනමට 2011.11.01 දින සිට පවරා දී ඇත. මෙම යාත්‍රාංගනය උතුරු/නැගෙනහිර තිබූ යුධමය තත්වය මත සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති අතර , සීනෝර් පදනම විසින් මෙම යාත්‍රාංගනය නැවත ප්‍රතිසංස්කරණය කිරිම සඳහා ආයෝජකයකු දේශියව හෝ විදේශියව සොයමින් සිටි. 2014 අයවැය මගින් ශ්‍රී ලංකා රජය මේ සඳහා රු. මිලියන 15 මුලිකව වෙන්කර ඇති අතර 2015 අයවැය මගින් රු. මිලියන 200 වෙන්කිරීමට බලාපොරොත්තු වේ. මෙමගින් උතුරු පළාතේ ධීවර ප්‍රජාවට පහසුකම් රැසක් අත්වේ.

*ජාත්‍යාන්තර ප්‍රමිති සහතික*

සී/ස සිනෝර් පදනම විසින් ජාත්‍යාන්තර තත්ව සහතිකය වන ISO 9001 : 2008 තත්ව සහතිකය සමාගමේ නිෂ්පාදන සඳහා ලබා ගෙන ඇති අතර එම සහතිකය 2009 වසරේ සිට මේ දක්වා නොකඩවා අඛන්ඩව පවත්වා ගෙන පැමිණ සිටි.

**ෆයිබර්ග්ලාස් යාත්‍රා හා ඒ ආශ්‍රිත නිපැයුම් නිශ්පාදන**

ෆයිබර්ග්ලාස් යාත්‍රා හා ඒ ආශ්‍රිත නිපැයුම් නිශ්පාදනය කිරම සමාලෝචනය කරනු ලබන 2013 වසර තුලදී අඩි 45 දිග ෂිම් වර්ගයේ යාත්‍රා 3 ක් නිෂ්පාදනය කල අතර ඒවා තල්මසුන් නැරඹීමේ සහ විනෝද කටයුතු සඳහා දකුණු ප්‍රදේශයේ භාවිතා කරයි. ට්‍රයිමරන් වර්ගයේ යාත්‍රා සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර තවත් එවැනි යාත්‍රා 3 ක් නිෂ්පාදනය කිරීම සඳහා පෞද්ගලික ගැණුම්කරුවන්ගෙන් ලැබී ඇත. තවද අඩි 55 සහ 49 ප්‍රමානයේ විශාල යාත්‍රා නිෂ්පාදනය ඇණවුම් මත පමණක් නිෂ්පාදනය කෙරේ.

වගුව 01

| වර්ගය | 2013 ඉලක්කය ඒකක | 2013 ප්‍රගතිය ඒකක | වටිනාකම රු.මිලියන |
|---|---|---|---|
| 49 1/2 ෆයිබර්ග්ලාස් යාත්‍රා | 01 | - | - |
| 45' සෂිමි යාත්‍රා | 03 | 02 | 26.84 |
| විනෝද යාත්‍රා | 05 | 02 | 1.60 |
| මිරිදිය ඔරු | 450 | 436 | 18.25 |
| 18 1/2 ,19 1/2 බෝට්ටු | 95 | 79 | 11.85 |
| පාරු | | | |
| පැඩල් යාත්‍රා | 04 | 04 | 0.63 |
| පැලට්ස් | 50 | 46 | 0.50 |
| මාළු පෙට්ටි/අයිස් පෙට්ටි | 150 | 125 | 1.26 |
| පාවෙන ජැටි | | | 0.76 |
| විවිධ අනෙකුත් නිශ්පාදන (අව් ගබඩා කිරීම් පෙට්ටි, ආරක්ෂක කුටි,ගැඹුරු දියෙහි මසුන් නෙලිය හැකි උපකරන යනාදිය ) | 1175 | 1065 | 12.46 |
| **එකතුව** | **1933** | **1759** | **73.39** |

- **නයිලෝන් මාළු දැල් නිශ්පාදනය**

  රජය විසින් ගනු ලැබු ප්‍රතිපත්තිමය තීරණයක් මත,හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතයි මත 2011.11.01 දින සිට සිනෝර් පදනම මගින් පාලනය වු වීරවිල හා ලුණුවිල මාළු දැල් කර්මාන්තශාලා දෙක නෝත් සී ආයතනය වෙත පවරා දී ඇත. ඒ අනුව ආයතන දෙක අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව වීරවිල හා ලුනුවිල

  දැල් කර්මාන්තශාලා දෙකෙහි නිෂ්පාදනය කරන ලද මාළු දැල් වල එකම අලෙවිකරුවා ලෙස සීනෝර් පදනම පත් කර ඇත.

- **අනෙකුත් ව්‍යාපෘති**

  - සීනෝර් සි ෆුඩ් භෝජනාගාරය

1988 වසරේදි ඔරියන්ට් පර්ල් හෝටල් සමාගම හා සිනෝර් පදනම සමඟ ඇති කර ගන්නා ලද කළමනාකරන ගිවිසුමක් යටතේ සිනෝර් සී ෆුඩ් භෝජනාගාරය මෙහෙයවනු ලබන අතර ආයෝජකයින් විසින් ඔවුන්ගේ ව්‍යාපාරික උපාය මාර්ග වෙනස් කරමින් එහි ආදායම උපරිම කර ගැනීමට කටයුතු කර ඇති නමුත් උත්පාදනය කර ගෙන ඇත්තේ සුළු ආදායමක් පමති. සීනෝර් පදනම සඳහා මාසික කුලී ආදායමක් හා ලාභය මත ලාභාංශ ආදායම් ප්‍රතිශතයක් ලැබිමට හිමිකමක් ඇත.

  - මත්තුමගල ස්වයංචලන වැඩහල

මෙම ව්‍යාපෘතිය 2006 වසරේ දී පොන්ටියර් ඔටෝමොබයිල් සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුමක් යටතේ ක්‍රියාත්මකය.

- **මානව සම්පත්**
-

2013.12.31 දින වන විට සමාගමේ සමස්ත සේවක සංඛ්‍යාව 93 ක් වු අතර, එය පහත දක්වන සංයුතියෙන් සමන්විත වි ඇත.

වගුව 02

| ස්ථානය | මුළු සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 51 |
| මට්ටක්කුලිය යාත්‍රාංගනය | 31 |
| සිල්ලර වෙළඳ සැල් | 09 |
| (බේරුවල, ගාල්ල,මාතර, තංගල්ල, වීරවීල හා ලුණුවිල ) --- ඉදිකිරීම් ව්‍යාපෘති | 02 |
| **එකතුව** | 93 |

ඉහත කී සේවක මණ්ඩලය පහත පරිදි සේවක ගනයන්ට වෙන් කර පෙන්විය හැක

- ස්ථිර සේවක මණ්ඩලය 76
- අනියම් සේවක මණ්ඩලය 01
- කොන්ත්‍රාත් පදනම මත සේවක මණ්ඩලය 15
- පුහුනු පදනම මත සේවක මණ්ඩලය 01

## 2013 වසර සඳහා මූල්‍ය ප්‍රගතිය

සමාගම 2013 වසර සඳහා රුපියල් 2,77,502.24 ( බදු වලට පසු) ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.සමාගම විසින් වර්ෂය තුල පහත සඳහන් ආකාරයට ආදායම් උපදවා ඇති අතර එහි එකතුව රුපියල් 267,097,142.90 කි.

වගුව 03

| | විස්තරය | ආදායම රු. | ශුද්ධ ලාභය රු. |
|---|---|---|---|
| 01 | සමාගමේ නිෂ්පාදන | 73,392,604.99 | 3,391,513.53 |
| 02 | වෙනත් මෙහෙයුම් ආදායම | 17,260,043.52 | } (8,810,999.25) |
| 03 | වෙළඳ ක්‍රියාකාරම් තුලින් ලැබු ආදායම | 113,045,648.74 | |
| 04 | ඉදිකිරීම් කටයුතු තුලින් ලැබු ආදායම | 58,800,654.76 | 5,696,987..96 |
| | **එකතුව** | **267,097,142.90** | **(277,502,.24)** |

වගුව 04

**පසුගිය වසර පහ සඳහා විශේෂිත දත්තයන්** **(රු.මිලියන)**

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 277.25 | 255.60 | 345.99 | 324.75 | 217.75 | 267.09 |
| දල ලාභය/අලාභය | 21.05 | 21.34 | 34.45 | 32.61 | 57.19 | 73.83 |
| ශුද්ධ ලාභය/අලාභය | (25.85) | (30.36) | (23.55) | (16.25) | (7.09) | 0.27 |
| කොටසක ඉපයීම | (6.46) | (7.59) | (5.89) | (4.06) | (1.77) | .070 |
| ස්ථාවර වත්කම් (ශුද්ධ අගය) | 80.66 | 346.97 | 338.56 | 274.19 | 287.58 | 309.50 |
| ස්ථාවර තැන්පතු | 6.02 | 6.02 | - | - | - | 1.30 |
| ජංගම වත්කම් | 141.18 | 198.72 | 125.59 | 180.91 | 191.63 | 186.58 |
| ජංගම බැරකම් | 118.67 | 104.67 | 149.98 | 218.67 | 227.51 | 225.93 |
| ජංගම නොවන බැරකම් | 100.91 | 97.96 | 95.31 | 71.64 | 28.50 | 46.93 |
| කොටස් ප්‍රාග්ධනය | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 |
| ප්‍රාග්ධනය සහ අනිකුත් සංචිත | 8.59 | 255.67 | 232.12 | 178.09 | 231.55 | 231.55 |

## වර්තමාන ක්‍රියාකාරකම් සහ අනාගත සැලසුම්

බංග්ලාදේශය හි පෞද්ගලික සමාගමක් සමඟ ආරම්භ කිරීමට නියමිත ෆයිබර්ග්ලාස් යාත්‍රා නිෂ්පාදනය කිරීමේ බද්ධ සමාගමේ මූලික කටයුතු සියල්ලක්ම මේ වන විට නිම වී ඇත. බංග්ලාදේශය තුල යාත්‍රාංගනයේ ඉදිකිරීම් කටයුතු නිම වී ඇති අතර, යාත්‍රා අච්චු මේ වන විට බංග්ලාදේශය වෙත අපනයනයද කර අවසන් වී ඇත. අදාල විදේශීය ආයෝජකයා සීමාසහිත සීනෝර් පදනම වෙත පැමින මෙම බද්ධ ව්‍යාපාරයේ ප්‍රගතිය සම්බන්ධයෙන් කරුනු දක්වා සිටින ලද අතර නව නෝබෝ දිනකින් එම බද්ධ ව්‍යාපර සමාගමේ ප්‍රථම අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත ඇති අතර නිෂ්පාදන කටයුතු ද 2014 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය.

- නෙදර්ලන්තයේ නෙඩිසන් ෆවුන්ඩේෂන් ආයතනය විසින් මිලදී ගන්නා ලද පළමු සෂිමි යාත්‍රාව නිෂ්පාදනය නිම කර සෝමලියා දේශයට අපනයනය කරන ලදි.

- ෆයිබර් කර්මාන්තයේ නව තාක්‍ෂණික දැනුමද උපයෝගි කර ගෙන පාවෙන භෝජනාගාර, පාවෙන නිවාස වැනි නිශ්පාදනය කිරීමට උත්සුක වනු ඇත.

- 2013 වසරේදී පෞද්ගලික අංශය හා තරග කල හැකි පරිදි සමාගමේ අලෙවි කරන කටයුතුවල වෙනස්කම් ද විකිනුම් ඒජන්තවරුන් පත් කිරීම තුලින් දිවයින පුරාම අලෙවි කටයුතු ව්‍යාප්ත කිරීමටද අවශ්‍ය පියවරයන් ගැනීම

- දික්ඕවිට වරාය ව්‍යාපෘතිය ක්‍රියාකාරී තත්වයට පත් වු විගස, එහි පැමිණෙන යාත්‍රා අළුත්වැඩියා කිරීම් එංජින් අළුත්වැඩියා කිරීම් වැනි කටයුතු සඳහා රු.මිලියන 250ක් වැය කර මට්ටක්කුලිය යාත්‍රාංගනය නවීන උපකරන හා ආයෝජනයන්ගෙන් සමන්විත යාත්‍රාංගනයක් බවට පත් කිරීම හා දික්ඕවිට වරාය තුලට පැමිනෙන සියළුම යාත්‍රාවන්ට අවශ්‍ය වන යාත්‍රා /එංජින් අළුත්වැඩියා කටයුතු පහසු මිලකට කර ගැනිමට පහසුකම් සැලසීම

- ජාත්‍යාන්තර වශයෙන් ගනුදෙනුකරුවන්ට පිලිගත හැකි සේවාවක් ලබාදීම හා විදේශීය ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් උනන්දු කරවා ගැනිම සඳහා සිනෝර් පදනම වෙත ජාත්‍යාන්තර වශයෙන් පිලිගත් ලොයිඩ් තත්ව සහතිකය ලබා ගැනිමට සැලසුම් කර ඇත.

ගුණසේකර රත්නායක සහ සමාගම
වරලත් ගණකාධිවරු

65, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02
ටෙලි/ෆැක්ස් - 011 -2335194 - 011 -2473833
විද්‍යුත් තැපැල : komseky@gmail.com

# විගණන වාර්තාව

**සීමාසහිත සීනෝර් පදනමේ කොටස්කරුවන් වෙත**

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

සීමාසහිත සීනෝර් පදනමේ 2013.12.31 දිනට පැවති මූල්‍ය තත්ව වාර්ථාව ඊට අදාල එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන විස්තීරණ, හිමිකම් වෙනස්වීමේ වාර්තාවද, මුදල් ප්‍රවාහය පිළිබඳ සාරාංශය සහ අනිකුත් සැලකිය යුතු ගිණුම් ප්‍රතිපත්තීන් හා විස්තරාත්මක සටහන් ද අපි විගණනය කළෙමු.

## මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ. වංචාවක් හේතුවෙන් හෝ වැරදීමක් හේතුවෙන් සිදුවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ගත යුතු අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් නිසි ගිණුම් ප්‍රතිපත්ති තෝරා ගැනීම හා අදාල කර ගැනීමත් අවස්ථාවෝචිත ඇස්තමේන්තු සැකසීමත් එකී වගකීමට අයත් වේ.

## විගණනයේ විෂය පථය හා විගණන මතය සඳහා පදනම

අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින්ට අනුකූලව අපගේ විගණනය පැවැත්වීමු. එකී ප්‍රමිතින්ට අනුව මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වලින් තොර බව තහවුරු කර ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන හෙළිදරව් කිරීම් සහ ප්‍රමාණයන්ගේ නිවරදිභාවය තහවුරු කරනු වස් නියදි පරීක්ෂණ පදනමක් මත කරනු පරීක්ෂා කිරීම විගණනයේ ඇතුලත් වෙයි.එසේම භාවිතා කළ ගිණුම් ප්‍රතිපත්ති සහ කලමණාකාරිත්වය විසින් කරනු ලැබ ඇති වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීමත් ඉදිරිපත් කරනු ලබන සමස්ත මූල්‍ය ප්‍රකාශය ඇගයීමත් ඊට ඇතුලත් වේ.

අපගේ විගණනය සඳහා අපගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට අවශ්‍යයයි හැගෙන සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගන්නා ලදි. එබැවින් අප විසින් දක්වන ලබන විගණන මතය සඳහා අපගේ විගණනය සාධාරණ පදනමක් සපයන බව අපගේ විශ්වාසය වේ.

**විගණන මතය**

අපගේ විගණන කටයුතු වලට අනුව සමාගම විසින් 2013.12.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා නිවරදිව ගිනුම් පවත්වාගෙන ගොස් ඇති බවත් 2013.12.31 දිනට සමාගමේ මුල්‍ය ප්‍රකාශය, වර්ෂය සඳහා පිලියෙල කර ඇති ලාභ/අලාභ වාර්තා, මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශ හා අනිකුත් සටහන් ශ්‍රි ලංකා ගිනුම්කරන ප්‍රමිතින්ට අනුකුලව පිලියෙල කර ඇති බවත් එමගින් සත්‍ය හා සාධාරන අදහසක් ලබා දෙන බවත් අපගේ මතය වේ.

අනිකුත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් ඃ

මෙම මුල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151(2) වගන්තියටද අනුකුල වන ලෙස සකස් කර ඇත.

අත්සන් කලේ.

**ගුණසේකර රත්නායක සහ සමාගම**
**වරලත් ගනකාධිකාරිවරු**
**කොළඹ**

10 ජුනි 2014

**සීමාසහිත සීනෝර් පදනම**

**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු: | රු : |
| ආදායම | 3 | 73,392,604.99 | 63,443,453.78 |
| විකුණුම් පිරිවැය | 4 | (62,441,119.06) | (50,594,833.18) |
| දළ ලාභය/ (අලාභය) | | 10,951,485.93 | 12,848,620.60 |
| ඉදිකිරීම් හා අලෙවි කටයුතු වලින් දළ ලාභය | 5 | 45,630,962.54 | 44,345,180.37 |
| වෙනත් මෙහෙයුම් අදායම් | 6 | 17,260,043.52 | 11,660,727.25 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 7 | (14,158,412.61) | (13,000,920.96) |
| පරිපාලන වියදම් | 8 | (47,299,258.69) | (50,079,616.44) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | (1,098,055.49) | (137,164.01) |
| මෙහෙයුම් ලාභය | | 11,286,765.20 | 5,636,826.81 |
| මූල්‍ය වියදම් | 10 | (10,727,241.55) | (9,776,318.68) |
| මූල්‍ය ආදායම් | 11 | 97,446.87 | 106,758.85 |
| බදු පෙර ලාභය | | 656,970.52 | (4,032,733.02) |
| අති විශේෂිත වියදම | | - | (2,741,297.42) |
| | | 656,970.52 | (6,774,030.44) |
| අදායම් බදු වියදම | 12 | (379,468.28) | (321,475.47) |
| වසරේ ශුද්ධ ලාභය / (අලාභය) | | 277,502.24 | (7,095,505.91) |

**සීමාසහිත සීනෝර් පදනම**

2013.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| **වත්කම්** | | රුපි : | රුපි : | රුපි : |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත හා උපකරන | 13 | 309,503,287.18 | 287,584,443.70 | 274,192,663.69 |
| කෙරිගෙන යන වැඩ | | 4,145,000.00 | 4,145,000.00 | 9,108,888.00 |
| ආයෝජන - ශ්‍රී බංගලා බෝට්ටු (පුද්ගලික) සමාගම | | 1,961,850.00 | 1,961,850.00 | 1,961,850.00 |
| ආයෝජන - මත්ස්‍ය ව්‍යාපෘතිය | | 2,239,404.26 | 2,239,404.26 | 2,239,404.26 |
| | | 317,849,541.44 | 295,930,697.96 | 287,502,805.95 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 14 | 65,730,342.09 | 82,183,537.95 | 66,220,033.14 |
| නෝත් සී ලිමටඩ් | | 38,845,840.65 | 38,845,840.65 | 38,845,840.65 |
| වෙළඳ ණය ගැති | 15 | 51,898,367.73 | 42,770,099.10 | 48,973,707.79 |
| සේවක ණය | 16 | 1,673,599.47 | 1,337,423.80 | 2,179,993.00 |
| වෙනත් ලැබිය යුතු | 17 | 26,379,838.32 | 24,089,539.66 | 21,070,221.00 |
| ඉල්ලුම් තැන්පතු | | 1,300,000.00 | 1,300,000.00 | 1,000,000.00 |
| අත ඉතිරි මුදල් හා බැංකු ශේෂ | 18 | 752,925.18 | 1,112,276.56 | 2,626,015.86 |
| | | 186,580,913.44 | 191,638,717.72 | 180,915,811.44 |
| **මුළු වත්කම්** | | **504,430,454.88** | **487,569,415.68** | **468,418,617.39** |
| **ස්කන්ධ හා වගකීම්** | | | | |
| **ස්කන්ධය** | | | | |
| කොටස් ප්‍රාග්ධනය | | 40,000,000.00 | 40,000,000.00 | 40,000,000.00 |
| අදායම් සංචිත | | 260,559,447.73 | 260,559,447.73 | 260,559,447.73 |
| ප්‍රග්ධන සංචිත | | 62,601,030.04 | 62,601,030.04 | 62,601,030.04 |
| ඉදිරියට ගෙන ආ අලාභ | | (131,606,875.46) | (131,604,918.32) | (185,066,913.51) |
| | | 231,553,602.31 | 231,555,559.45 | 178,093,564.26 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| අමාත්‍යංශයෙන් ලැබීම් | 19 | 2,078,392.40 | 2,078,392.40 | 2,078,392.40 |
| විලම්භිත වගකීම් | 20 | 44,425,160.73 | 25,389,761.48 | 9,012,594.08 |
| පොළිය සහිත ණය | 21 | 434,884.76 | 757,297.74 | - |
| සුනාමි පුනරුත්තාපන වැඩසටහන | | - | - | 60,557,501.10 |
| | | 46,938,437.89 | 28,225,451.62 | 71,648,487.58 |
| **ජංගම බැරකම්** | | | | |
| පොළිය සහිත ණය | 22 | 322,411.11 | 275,936.71 | - |
| වෙළඳ ණය හිමියෝ | 23 | 49,603,067.45 | 45,077,649.64 | 66,513,473.00 |
| වෙනත් ගෙවිය යුතු | 24 | 81,897,545.88 | 81,420,718.36 | 90,252,192.04 |
| යාපනය වෙනුවෙන් වු වන්දි ගෙවීම් අරමුදල | | 118,819.63 | 118,819.63 | 118,819.63 |
| අදායම් බදු | 25 | (5,389,530.24) | 3,237,242.11 | 2,546,806.64 |
| කෙටි කාලීන ණය | 26 | 63,209,065.34 | 54,530,838.34 | 42,923,650.91 |
| බැංකු අයිරා | 27 | 36,177,285.51 | 43,127,449.82 | 27,222,623.33 |
| | | **225,938,664.68** | **227,788,654.61** | **229,577,565.55** |
| **මුළු වගකීම්** | | 272,876,852.58 | 256,013,856.23 | 290,325,053.13 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **504,430,454.88** | **487,569,415.68** | **468,418,617.39** |

ගිණුම් කරන ප්‍රතිපත්තීන් හා සටහන් සම්පූර්ණයෙන්ම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන අතර මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ 2007 අංක 7 දරණ සමාගම් පනතේ අනුකූලතාවයන්ට යටත්ව බව සහතික කරමු.

අත්සන් කලේ .
එච්.ඩී.ඩී මධුකා
මුදල් කළමණාකරු

මෙම ගිණුම් වාර්ථා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

අත්සන් කලේ :
ඉංජිනේරු බී.වී.සරත් කුමාර ද සිල්වා
සභාපති/ අධ්‍යක්ෂක
27-05-2013

අත්සන් කලේ :
කේ. උපිත් අනුරාධ
අධ්‍යක්ෂක
27-05-2013

**සිමාසහිත සීනෝර් පදනම**
**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය**

| | කොටස් ප්‍රග්ධනය රුපි : | ප්‍රග්ධන සංචිත රුපි : | ප්‍රත්‍යාගණන සංචිත රුපි : | ඉදිරියට ගෙන ආ ලාභ/අලාභ රුපි : | මුළු ස්කන්ධ ප්‍රග්ධනය රුපි : |
|---|---|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 40,000,000.00 | 62,601,030.00 | 260,559,447.00 | (185,066,914.00) | 178,093,563.00 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | (7,095,506.00) | (7,095,506.00) |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | - | - | - | 60,278,042.30 | |
| 2012.12.31 දිනට ශේෂය | 40,000,000.00 | 62,601,030.00 | 260,559,447.00 | (131,884,377.70) | 170,998,057.00 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 277,502.24 | |
| 2013.12.31 දිනට ශේෂය | 40,000,000.00 | 62,601,030.00 | 260,559,447.00 | (131,606,875.46) | 170,998,057.00 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | සීමාසහිත සීනෝර් පදනම | | |
| | 2013.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය | රුපි : | රුපි : |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය** | | |
| | බදු පෙර ශුද්ධ ලාභය | 656,970.52 | (6,774,030.44) |
| එකතු කළා - | ක්ෂය විම් | 12,924,336.02 | 6,916,883.73 |
| | පාරිතෝෂිත සඳහා වෙන් කිරිම් | 1,659,184.64 | 3,693,261.39 |
| | පොළි වියදම් | 10,449,152.19 | 9,458,181.61 |
| අඩු කළ - | ස්ථාවර වත්කම් විකිනිමෙන් ලද ලාභය | - | (436,520.00) |
| | පෙර වර්ෂයේ ගැලපිම් | (279,459.38) | 368,709.06 |
| | කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් කියයාකාරකම් මත ලාභය | **25,410,183.99** | **13,226,485.35** |
| | තොග අඩුවිම්( වැඩිවිම්) | 16,453,195.86 | (15,963,504.81) |
| | ණය ගැතියන්ගේ අඩුවිම(වැඩිවිම්) | (20,760,983.59) | 4,026,859.23 |
| | ණය හිමියන්ගේ (අඩුවිම්) වැඩිවිම | 5,002,245.33 | (19,366,297.04) |
| | විලම්භිත අදායම් (අඩුවිම්) වැඩිවිම් | 18,867,642.25 | - |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය** | 44,972,283.84 | (18,076,457.27) |
| අඩු කළ - | ආයෝජන ආදායම | (97,446.87) | (106,758.85) |
| | පොළි ගෙවිම් | (10,449,152.19) | 9,458,181.61 |
| | අදායම් බදු ගෙවිම | - | - |
| | සේවාන්ථ දීමනා ගෙවිම් | (1,491,427.64) | (916,237.00) |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | 32,934,257.14 | (9,641,271.51) |
| | **අයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | |
| | ස්ථාවර වත්කම් විකිණිම මිලට ගැනීම | (34,843,179.50) | 4,963,888.00 |
| | කෙරිගෙන යන වැඩ | - | (20,333,662.74) |
| | ආයෝජන ආදායම් | 97,446.87 | 106,758.85 |
| | ආයෝජන - ශ්‍රී බංගලා බොට් (පුද්) සමාගම | - | 461,250.00 |
| | කෙටිකාලීන ණය | 8,678,227.00 | 11,607,187.43 |
| | **අයෝජන ක්‍රියාකාරකම් මත ශු .මුදල් ප්‍රවාහය** | (26,067,505.63) | (3,194,578.46) |
| | **මූල්‍ය කියයාකාරකම් මත ජනිත වු මුදල් ප්‍රවාහය** | | |
| | රාජ්‍ය ප්‍රදාන | - | 13,600,143.48 |
| | කල් බදු ණය හිමියන්ට ගෙවිම් | (275,938.58) | 1,033,234.45 |
| | **මූල්‍ය ක්‍රියාකාරකම් මත ශු මුදල් ප්‍රවාහය** | (275,938.58) | 14,633,377.93 |
| | මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශු. වෙනස් විම | 6,590,812.93 | (17,118,565.26) |
| | මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ වර්ෂ අරම්භක ශේෂ | (40,715,173.26) | (23,596,608.00) |
